Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## සරසවි සටන හුදකලා නොකළ යුතු ය

මාස තුනකට අධික කාලයක් තිස්සේ ඇදෙමින් පවතින සරසවි ආචාර්යවරුන්ගේ වර්ජනය සඳහා ආණ්ඩුව දෙන විසඳුම කුමක්ද යන්න ගැන රටම අවධානයෙන් බලා සිටියි. අධ්‍යාපන ඇමතිවරුන් දෙදෙනකු පෙරටුකොටගත් ආණ්ඩුව මේ ගැන නෑසූ කන්ව සිටියදී ආචාර්යවරු හා ශිෂ්‍යයෝ පියවරෙන් පියවර තම අරගලය තීව්‍ර කරමින් සිටිති. කාසච්ඡා විරෝධතා වර්ජන ඔස්සේ එය වීදි සටනක් දක්වා වර්ධනය වී තිබේ. ඊළඟ පියවර මාරාන්තික උපවාසයක් යයි ආරංචි පැතිර යමින් තිබේ. සැබැවින්ම මේ සිදුවෙමින් පවතින්නේ කුමක්ද? ආණ්ඩුවේ ආදායමින් අධ්‍යාපනය සඳහා වැය කරන ප්‍රමාණය 6% සක්වා වැඩි කර ගැනීම උදෙසා රටේ සරසවි ආචාර්යවරුන්ට හා ශිෂ්‍යයන්ට පමණක්ම පාරට බැස අරගල කරන්නට සිදුවීම අපට පෙන්වා දෙන්නේ රටේ අධ්‍යාපනයේ වටිනාකම ගැන රටේ බහුතරයකට ඇති අවබෝධයේ තරම යි. අනාගත පරපුරේ හෙට දවස වෙනුවෙන් කරන සැබෑ අරගලයක් හුදකලා සටනක් ලෙස වර්ග කොට මේසා කාලයක් තිස්සේ පසෙකට දැමීමට ආණ්ඩුවට හැකි වී තිබෙන්නේ ජනතාවගේ ඒ අවබෝධයේ තරම නිසාම විය යුතු ය. මේ ප්‍රශ්නය දෙස මුල සිටම විමර්ශනාත්මකව බලා සිටි බොහෝ අයට වැටහුණ සත්‍යය මෙය විය යුතු යයි අපට සිතෙයි.

කුළුනු, උද්‍යාන, ක්‍රීඩාංගන ආදී තමන් පිම්බීම සඳහා මෙන්ම ගුවන් සේවා, වරාය වැනි අති දැවැන්ත සුදු අලි ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන් කෝටි ගණනින් නිර්ලෝභීව වියදම් කරන රජයකට රටේ අධ්‍යාපනය වෙනුවෙන් මේ මුදල් ප්‍රමාණය වෙන් කිරීමට නොහැකි යයි කීම පිළිගත හැකි ද? ගැටළුව ඇත්තේ මේ දීම නොව දීමෙන් ලැබෙන දේ පිළිබඳව ය. එහි ගෞරවය ලැබීම පිළිබඳව ය.

දීර්ඝ සටන් ඉතිහාසයකට උරුමකම් කියන ලාංකීය වමේ ව්‍යාපාරයත් රටේ වෘත්තීය සමිති ව්‍යාපාර හා සමිති සමාගම් ප්‍රධාන විපක්ෂය ප්‍රමුඛ දේශපාලන පක්ෂ හා සංවිධාන මේ සාධාරණ අරගලයට සමගාමීව ප්‍රායෝගික තලයේ සක්‍රිය සහයෝගයක් දීමෙන් වැළකී සිටියේ මන්ද? ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකි බව පෙනි පෙනීත් නාමමාත්‍රික සහයෝගයෙන් පමණක් ඔවුන් සෑහීමකට පත් වූයේ කෙසේද? ඒ තුළ ඇත්තේ ද ඉල්ලීම් දිනා ගැනීම නොව ඉන්පසු ලැබෙන ජයග්‍රහණයේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයයි.

අප නම් මේ තත්වය හඳුන්වන්නේ අමු කුහකත්වය කියා ය.

සංස්කාරක




# බොල බූරු පුතේ දුක සෝකා ඉතින් ඉවසන්

කේ කේ සමන් කුමාර

සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වළා කැරළි පලසකි මේ
මග දිග ඇතිරූ
අහස සූරන මැදුරූ

1977 දී ඇතිවූ විපරීත සමාජ ක්‍රමය පිළිබඳව ලූෂන් බුලත්සිංහල සහෘදයාණන් එදා සිත්තම් කළේ එසේය. අනතුරුව අහස්කුස සිසාරා තාරාවන් ඉගිල යන්නට පටන් ගති.

ආනන්ද එස් විජයසිරි සහෘදයා මේ සිත්තම් කළේ මෙසේය

බොල බූරු පුතේ
දුක සෝකා ඉතින් ඉවසන්
අපි යන්න යමූ
අපි යන්න යමූ
දෙව් ලෝකෙ බලා විලසින්
බොල බූරු පුතේ

තාරාවන් ඉගිලෙන බූරු පුතුන් දිව්‍ය ලෝකේ යන කාලකණ්ණි සමාජ ක්‍රමයක් , තිරුවානා ගල් යට ගොස් ගොම රිති උඩ එන අබුද්දස්ස යුගයක දිවි ගෙවමු. ඒ ගැන අනාවැකි කීවුන්ද අඩුවක් නැතිව ඊටම උඩ ගෙඩි දෙති.

ඉතාලි ජාතික තෝමස් කොලෝඩිගේ ලෝක ප්‍රකට ළමා සාහිත්‍ය කෘතියක් වන පිනෝකියෝ හෙවත් රූකඩ පැංචා කතාන්දරයේ හා හාපුරා කියා පාසල් යන්නට යන පිනෝකියෝව රවටන කපටි නරියකු සහ දුෂ්ඨ බළලෙකු ඔහුගේ හෝඩි පොත විකුණා පිනෝකියෝව කානිවල් එකකට කැටුව යයි. එහිදී සෙල්ලම්ලන්තයට යන දුම්රියක නැග එහි යන පිනෝකියෝ බූරුවකු බවට පත්වේ.

ඉතාලිය තුළ සිදුවූ අධ්‍යාපනය විකුණා දැමීමේ ක්‍රියාවලිය තෝමස් කොලෝඩි නම් ඒ මහා ගත්කරුවාණන් දුටුවේ එසේය.

දැන් ඒ කපටි නරියා සහ දුෂ්ඨ බළලා මෙහි පැමිණ සිටී. ආදරණීය අම්මේ තාත්තේ, තක්කඩි වෙළෙන්දන්ගේද, විපරීත කානිවල්කරුවන්ගේද උන්ගේ අප්පා වන ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද කොන්ත්‍රාත්තුව මත ඔබේ දරුවා සෙල්ලම්ලන්තයට යවා බූරුවකු බවට පත් කිරීමේ කාරිය මේ කපටි නරියාත් දුෂ්ඨ බළලාත් විසින් බාර ගෙන තිබේ.

ආදරණීය අම්මේ තාත්තේ ඔබ බූරුවකු විය හැකිය. එහෙත් ඔබේ දරුවා බූරුවකු වනවාට ඔබ කැමතිද?

පිනාකියෝට පසුව සිය පියා හමුවන්නේ තල්මසකුගේ බඩ ඇතුළේදීය. මේ කොලෝඩි සහ පියා එකම ණයකරුවකු විසින් ගිල ගැනීම දක්වන සංකේතය බව විචාරකයන් විසින් විග්‍රහ කරනු ලැබීය. ආදරණීය අම්මේ තාත්තේ, ලෝක බැකුව නම් තල්මසාගේ බඩ තුළ ඔබේත් ඔබේ දරුවාගේත් ජීවිත ග්‍රහණය වී ඇත. ඉන්

4 වන පිටට